“කවරෙකු මුඃමින්වරයකුගෙන් මෙලොව පීඩාවන් අතරින් පීඩාවක් ඉවත් කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ පවතින පීඩා අතරින් පීඩාවක් අල්ලාහ් ඔහුගෙන් ඉවත් කරනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “කවරෙකු මුඃමින්වරයකුගෙන් මෙලොව පීඩාවන් අතරින් පීඩාවක් ඉවත් කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ පවතින පීඩා අතරින් පීඩාවක් අල්ලාහ් ඔහුගෙන් ඉවත් කරනු ඇත. කවරෙකු දුෂ්කරතා ඇත්තෙකුට පහසුව සලසන්නේ ද මෙලොව හා මතුලොවදී අල්ලාහ් ඔහුට පහසුව සලසනු ඇත. කවරෙකු මුස්ලිම්වරයකු(ගේ වරදක්) සඟවන්නේ ද මෙලොව හා මතුලොවෙහි අල්ලාහ් ඔහුව සඟවනු ඇත. ගැත්තා තම සහෝදරයට උදව් කරමින් සිටින කල්තාක් අල්ලාහ් එම ගැත්තාට උදව් කරමින් සිටියි. කවරෙකු දැනුම සොයමින් මාර්ගයක ගමන් කරන්නේ ද එමගින් ස්වර්ගය වෙත වූ මාර්ගය අල්ලාහ් ඔහුට පහසු කරනු ඇත. අල්ලාහ්ගේ නිවෙස් අතරින් නිවසක පිරිසක් වාඩි වී අල්ලාහ්ගේ ග්රන්ථය කියවමින් ඔවුන් අතර එය අධ්යයනය කරමින් වාඩි වී සිටින්නේ ද
ඔවුන් වෙත සැනසුම පහළ වී ආශිර්වාදය ඔවුන් ආවරණය කර මලක්වරුන් ඔවුන් පිරිවරා සිටිනු
මිස නැත. අල්ලාහ් ද ඔහු අබියස සිටින්නන් අතර ඔවුන් ගැන මෙනෙහි කරනු ඇත. යහපත් ක්රියාවන්හි මන්දගාමී තැනැත්තා, ඔහුගේ (ඉහළ) පරම්පරාව ඔහුට ඉදිරියට යාමට ඉඩ
නොදේ.”
[صحيح] [رواه مسلم]

අල්ලාහ් අබියස මුස්ලිම්වයකුට ප්රතිඵල පිහිටනුයේ එම මුස්ලිම්වරයා සෙසු මුස්ලිම්වරුන් සමග කටයුතු කරන ක්රියා වර්ගයෙන්මය. ඒ අනුව කවරෙකු මුඃමින්වරයකු ගෙන් පීඩාවක් හා මෙලොව පීඩාවන් අතරින් දැඩි දුෂ්කරතාවක් ඉවත් කරන්නේ ද, ඔහුට පහසුකම් සලසා දී සහන සළසන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ පවතින පීඩා අතරින් පීඩාවක් අල්ලාහ් ඔහුගෙන් ඉවත් කර ඔහුට සහන සලසනු ඇත. තවද දුෂ්කරතා ඇති උදවියට කවරෙකු සහන සළසන්නේ ද, ඔහුගේ අපහසුව ඉවත් කරන්නේ ද මෙලොව මෙන්ම මතුලොවෙහි ද අල්ලාහ් ඔහුට පහසුව සළසනු ඇත. කවරෙකු මුස්ලිම්වරයකුගේ වරදක් සඟවන්නේ ද එය, හෙළි කිරීමට නුසුදුසු වැරදි හා අන්තරායන් ඔහුගෙන් දකින්නාක් මෙන්ය. මෙලොව හා මතුලොවෙහි අල්ලාහ් ඔහුව සඟවනු ඇත. ගැත්තා තම සහෝදරයාට ඔහුගේ ආගමික හා ලෞකික යහපත් කටයුතුවලදී උදව් කරමින් සිටින කල්තාක් අල්ලාහ් එම ගැත්තාට උදව් කරමින් සිටියි. එසේ උදව් කිරීම ප්රාර්ථනාවෙන් හෝ කායික වශයෙන් හෝ මුදල්මය වශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ විය හැකිය. අල්ලාහ්ගේ තෘප්තිය අපේක්ෂාවෙන් කවරෙකු ආගමික දැනුම සොයන්නට යම් මාර්ගයක ගමන් කරන්නේ ද එමගින් ස්වර්ගය වෙත වූ මාර්ගය අල්ලාහ් ඔහුට පහසු කරනු ඇත. අල්ලාහ්ගේ නිවෙස් අතරින් නිවසක පිරිසක් අල්ලාහ්ගේ ග්රන්ථය කියවමින් ඔවුන් අතර එය අධ්යයනය කරමින් වාඩි වී සිටින්නේ ද, ඔවුන් වෙත සැනසුම, ගෞරවය පහළවනු ඇත. අල්ලාහ්ගේ ආශිර්වාදය ඔවුන් ආවරණය කර, ඔවුන්ව වට කරනු ඇත. මලක්වරුන් ඔවුන් පිරිවරා සිටිනු ඇත. අල්ලාහ් ද ඔහු අබියස සිටින්නන් අතර ඔවුන් ගැන මෙනෙහි කරනු ඇත. උසස් පිරිසක් අතර ගැත්තා ගැන අල්ලාහ් මෙනෙහි කිරීම ප්රමාණවත් ගෞරවය වේ. කවරෙකුගේ යහපත් ක්රියාවන් හීන වී ගියේ ද ඔහු යහපත් ක්රියාවන් සිදු කළ ජනයාගේ තරාතිරම

ලඟා කර ගන්නේ නැත. ඔහු පරම්පරාවේ ගෞරවය සහ පියවරුන්ගේ මහිමය මත රඳා නොසිටිය යුතු අතර යහපත් ක්රියාවන්හි අඩුවක් නො දැක්විය යුතුයි.

http://sunnah.global/hadeeth/si/show/4801